# <u>ඔසු වවමු ඉසුරු ලබමු</u>

## *කලාඳුරු අල*



- උද්භිද නාමය :- *Cyperus rotundus  L*
- ශාක කුලය :- Cyperaceae
- පොදු සිංහල නම :- කලාඳුරු අල
- සංස්කෘත නම :- මුස්තක
- දෙමළ නම :- කොරෙ කිලංගු
- ඉංග්‍රීසි  නම :- Nut Grass
- රෝපණ ද්‍රව්‍ය :- අමු අල හෝ ලපටි පැලෑටි
- ඖෂධ සදහා ගැනෙන අංගයන් :- භූගත කඳ හෙවත් කලාදුරු අල

## හැඳින්වීම

තෘණ කුලයට අයත් ශාකයක් වන අතර වියලි හා තෙත් කලාපීය පරිසර වල දැකිය හැක. වියලි කුඹුරු, මුඩු බිම්, පර්වත වල එක් රැස් වූ පස් ගොඩවල් ආශ්‍රිත ව බහුලව දැකිය හැක. ආයුර්වේද ග්‍රන්ථ තුල නාගර මුස්ත, භද්‍ර මුස්ත , කෛවර්ත මුස්ත ආදී වශයෙන් වර්ග තිබුනත් වර්ථමානයේ බහුලව ලංකාවේ කලාදුරු අල වශයෙන් හැදින්වෙන් භද්‍ර මුස්තක භාවිතා කරයි. හීං කලාදුරු , මහ කලාදුරු හා දිය කලාදුරු වශයෙන් ද ලංකාව තුල තවත් බෙදීමක් පවතී.

## උද්භිද විද්‍යාත්මක විස්තරය

ඉලිප්සාකාර හෝ වටකුරු අන්ඩාකාර භූගත කඳක් සහිත බහු වාර්ෂික පැළෑටියකි . අලය මිලිමීටර 12ක් පමණ දිගුවන අතර මිලිමීටර 3-7 පමණ පළලින් යුතුවේ . සුගන්ධවත්ය. අලය වටා සිහින් තන්තු මුල් ඇත . අලයෙන් ඇතිවන ශාඛා මඟින් නව පැළෑටි බිහි කරයි . සිහින් දිගැටි පත්‍ර සෙන්ටිමීටර 10-40  පමණ දිග වන අතර පත්‍ර  ත්‍රිකෝණික හැඩයක් ගනියි.

## කෘෂි විද්‍යාත්මක විස්තරය

ලංකාව වානිජ වශයෙන් වගා කිරීමක් එතරම් දක්නට නොලැබුනත් ඉන්දියාව තුල සුළු පරිමානයෙන් වගා කරනු ලබයි. බිම් වල ඇති ශාක උදුරා අල දැනට බාවිතා කරයි. වල් පැලෑටියක් වශයෙන් හැදින්වෙන නිසා කුඩා කාලයෙදීම වල් නාශක යෙදීමෙන් හෝ ගලවා ඉවත් කිරීමෙන් විනාශ කරන් නිසා ඖෂධ සදහා කොටසක් ඉන්දියාව වැනි රටවලින් ආනයනය කරනු ලබයි. හොදින් මේරූ අල හෝ ලපටි ශාක අඩි 2×2 වලවල් වල කොම්පොස්ට් පොහොර යොදා වගා කල හැකිය. පදුරු අතර පරතරය අඩි 1 පමණ තබා ගැනීම ප්‍රමානවත් අතර රසායනික පොහොර අවශ්‍ය නොවේ. හොදින් පදුරු දමා ශාකය මිය යාමට ආසන්න වන විට අස්වනු සදහා උදුරා ගත හැකිය.

## අස්වනු නෙලීම හා ගබඩා කිරීම

වගා කර අවුරුදු එකක් දෙකක් අතර කාලයේදී අස්වනු සදහා ශාක උදුරා ගත හැක. වියලි පරිසර තත්ව යටතේදී සාර්ථක අස්වැන්නක් ලබා ගත හැකිය. අල වෙන් කර මුල් ආදිය ඉවත් කර හොදින් හිරු එලියේ වියලා පිරිසිදු භාජන වල වියලි තත්ව යටතේ ගබඩා කිරීමෙන් ඖෂධීය ගුනයට හානි නොවන වැඩි කාලයක් තබා ගැනීම සිදු කල හැකිය.

## වර්ථමාන භාවිතය හා වෙළදපොල තත්වය

ආයුර්වේද ඖෂධ වන අරිෂ්ඨ, ආසව,චූර්න, තෙල් වර්ග ආදිය නිෂ්පාදනට බහුලව භාවිතා වන අතර ලංකාව තුල ඒ සදහා අඛණ්ඩ සැපයුමක් නොමැති නිසා ඉන්දියාවෙන් ආනයනය කරනු ලබයි. වානිජමය වශයෙන් වගා කිරීමෙන් දේශීය වෙළදපොල තුල හොද මිලක් ලබා ගත හැකි අමු ද්‍රව්‍යකි. වර්තමානයේ කිලෝවක් සදහා රු. 800/= - 1200/= අතර මිලක් පවතී.